## බස්නාහිර පළාත්රාජ්‍ය සේවයේ ක්ෂේත්‍රගත නිලධාරි - බණ්ඩ 2 සේවා ගණයේ සංස්කෘතික නිලධාරි තනතුර සඳහා වන උසස් කිරීමේ පරිපාටිය

(උසස් කිරීමේ පරිපාටිය අනුමත වන දිනට සේවයේ යෙදී සිටින නිලධාරීන්ට පමණක් අදාළ වේ.)

**1. සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව -

- යොමුඅංකය: දිනය :

1.2 අමාත්‍යාංශය - කෘෂිකර්ම, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

- යොමු අංකය :කෘ/ආපාxvi/සං.කලා/1/3 දිනය : 2014.10.10

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම - යොමු අංකය :DMS/D/පොදු 11-2 දිනය ::2012.12.17

1.4 ප්‍රධාන ලේකම්(බ.ප) නිර්දේශය - යොමු අංකය : CS 01/ETR/3/2/7 (ii) දිනය : 2014-11-21

1.5 ජාතික වැටුප් කොමිෂන්සභාවේනිර්දේශය - යොමු අංකය : දිනය :

1.6 බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය -යොමු අංකය : 1/4/2/5/48 දිනය :2015.01.02

1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය - යොමු අංකය : දිනය :

**2. පත්කිරීම් බලධාරියා** - බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**ක්‍රියාත්මක වන දිනය** - ගරු ආණ්ඩුකාර තුමා අනුමත කළ දින සිට

**3. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය - ක්ෂේත්‍රගත නිලධාරි

3.2 ශ්‍රේණි - 11, 1 ශ්‍රේණි

3.3 පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය

තනතුරට පැවරෙන ප්‍රධාන කාර්යභාරය වශයෙන් කිසියම් පනතක් /ආඥාපනතක් /ප්‍රඥප්තියක් මගින් නිල නාමයෙන් විශේෂිත කොට පවරනු ලබන බලාත්මක කිරීමේ /නියාමනය කිරීමේ /විධිමත් කිරීමේ නෛතික කාර්යයන් විධායක නිලධරයන්ගේ අධීක්ෂණය යටතේ පැවරෙන්නා වූද, බඳවාගැනීමේ මූලික සුදුසුකම් වශයෙන් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් අධ්‍යාපන සුදුසුකම් ලෙස අවශ්‍ය වන්නාවූද සේවා ගණයකි.

3.4 කාර්යයන් පැවරීම

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදුනොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවයමත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව මත පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

අනුමත කරමි / ~~නොකරමි.~~

දිනය 10/2/15

ආණ්ඩුකාරවර.

PDF Compressor Pro

4. තනතුරෙහි /තනතුරුවල ස්වභාවය - ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත

5. වැටුප්

5.1 වැටුප් කේත අංකය - MN 5 – 2006 A

5.2 වැටුප් පරිමාණය 16,720 – 10x320-11x365 -15x450 -30,685/=

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය රු. |
|---|---|---|
| 11 | පියවර 01 | 16,720/= |
| 1 | පියවර 12 | 20,285/= |

6. සේවා ගණයට අයත් තනතුර / තනතුරු

6.1 අනුමත තනතුර නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| සංස්කෘතික නිලධාරි | 11<br>1 | 11 | • බස්නාහිර පළාතට සුවිශේෂී සංස්කෘතික අනන්‍යතාවය හඳුනාගනිමින් සංස්කෘතික ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා සෑම පියවරක්ම ගැනීම<br>• කලා සංගම් සක්‍රියව පවත්වාගෙන යාම<br>• කලායතන පිහිටුවීම,අධීක්ෂණය, සංවර්ධනය, කුසලතා ඇගයීම පිණිස කලා උළෙල පැවැත්වීම<br>• බිම් මට්ටමේ සිටින කෙටි නාට්‍යකරුවන් ජාතික තලයට ගෙන ඒම පිණිස නේවාසික වැඩමුළු හා කෙටි නාට්‍ය උළෙල පැවැත්වීම<br>• ප්‍රාදේශීය මට්ටමින් ඇගයීමට ලක් නොවූ කලාකරුවන් ඇගයීම හා සුභසාධනය නංවාලීම<br>• ජන ශ්‍රැති හා පෞරාණික ලේඛණ සුරක්ෂිත කිරීම හා ප්‍රජාව දැනුවත් කිරීම<br>• දහම් ගුරු සභාව පිහිටුවීම , දහම් අධ්‍යාපන ප්‍රවර්ධනය හා සුභසාධනය නංවාලීම<br>• ආගමික සිද්ධස්ථානවල සංවර්ධනය උදෙසා සම්බන්ධීකාරකයෙකු ලෙස කටයුතු කිරීම<br>• ජාතික හා ආගමික වශයෙන් වැදගත් සංස්කෘතික උත්සව සඳහා සහභාගීවීම, සංවිධානය හා පැවැත්වීම<br>• සංස්කෘතික හුවමාරු වැඩසටහන් සංවිධානය හා පැවැත්වීම<br>• පුද්ගල ආධ්‍යාත්මික රසඥතාවය ප්‍රවර්ධනය සඳහා ක්‍රියාකාරකම් හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - 11

උසස් කිරීමේ කාර්යය සඳහා සේවා ගණයේ 11, 1 ශ්‍රේණි ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

PDF Compressor Pro

7. බඳවා ගැනීමේ ක්‍රමය

- දැනට තනතුර දරණ නිලධාරීන්ට පෞද්ගලික වනසේ පිළිසෙල කරනු ලබන උසස් කිරීමේ පරිපාටියක් බැවින් බඳවා ගැනීම අදාළ නොවේ.

8. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/වෘත්තීය පරීක්ෂණය/සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම | 11 ශ්‍රේණියට පත්වී වසර තුන (3) ක් ගතවීමට පෙර | ලිඛිත (ඇමුණුම 01) |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | 1 ශ්‍රේණියට උසස්වී වසර පහ (5) ක් ගතවීමට පෙර | ලිඛිත (ඇමුණුම 02) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ

කොපමණ කාලයකට වරක්ද - වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද?

පළමුවන කාර්යක්ෂමතා කඩඉම<br>
දෙවන කාර්යක්ෂමතා කඩඉම

} - බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරනු ලබන ආයතනයක්

9. භාෂා ප්‍රවීනතාව

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීනතාවය |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාව පරිවාස කාලය තුල ලබාගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීනතාවය ලබාගත යුතුය. |
| සන්ධාන භාෂාව | අදාළ නොවේ |



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 11 වන ශ්‍රේණියේ සිට 1වන ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. පත්වීම ස්ථිර කර තිබීම
ii. සේවා ගණයේ 11 ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුල සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම
iii. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්කිරීමේ දිනට පෙරාතුව වසර දහය (10) ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම
iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම
v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම
vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් 1 වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා අදාළ පත්වීම් බලධරයා වෙත නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම 3) මගින් ඉල්ලීමක් කල විට සේවයේ වසර දහය (10) සම්පූර්ණ කරන දින හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි 1 ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදුකරනු ලැබේ.

11. තනතුරුවලට පත්කිරීම - අදාළ නොවේ

12. බන්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන වලටද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයටද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝග වලටද , අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු නියෝගවලටද අනුව කටයුතු කල යුතුය.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :1/1/4/294 දිනය :2015.02.12

PDF Compressor Pro

13. බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන

බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපන කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීම

- මෙම බඳවාගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින සේවකයන් ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ වැටුප් පරිවර්ථන ක්‍රමවේදයට අනුව පහත සඳහන් පරිදි නව ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. එහෙත් අන්තර්ග්‍රහණය හේතුවෙන් වැටුප් වර්ධක දිනයේ වෙනසක් සිදු නොවන අතර , එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක වේ. එසේම අනුරූපී වැටුප් පියවරක් හිමි වීම හේතු කොට ගෙන ඊළඟ වැටුප් පියවරෙහි තබනු නොලැබේ.

i. මෙම උසස් වීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සංස්කෘතික නිලධාරි තනතුරේ වසර 10 ක සේවා කාලයක් සපුරා නොමැති නිලධාරීන් 11 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.
ii. මෙම උසස්වීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සංස්කෘතික නිලධාරි තනතුරේ වසර 10 ක සේවා කාලයක් සපුරා ඇති නිලධාරීන් 1 ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

අන්තර්ග්‍රහණය කිරීමෙන් අනතුරුව උසස් කිරීමේ පරිපාටියේ සඳහන් ඒ ඒ ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් නිලධාරීන් විසින් සම්පූර්ණ කරනු ලැබිය යුතු වේ.

15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය 1/4/4/2/15 දිනය 2015.02.10

PDF Compressor Pro

අර්ථනිරූපන

➢ සතුටුදායක සේවා කාලය

i. සතුටුදායක සේවයක් යනු නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටුකිරීම මගින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත්වීම මගින්ද , සිදුකළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද , එම කාලය තුළදී උපයා ගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තාවූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදුනොකරන ලද්දාවූ කාලසීමාවක් වන්නේය.

ii. නිලධාරියා වෙත ලබාදිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා,අඩුකොට ,නතර කොට හෝ විලම්බනය කොට ඇති කාලපරිච්ඡේදයක් වේ නම් එයද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා විනය කාර්යය පරිපාටි සංග්‍රහය, ආයතන සංග්‍රහයේ 11 කොටසේ වැරදි පිළිබඳ පළමු උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකොට ඇති විට එම වරද සිදුකරනු ලැබූ දිනසිට වසර තුනක කාලයක්ද සහ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා විනය කාර්යය පරිපාටි සංග්‍රහය, ආයතන සංග්‍රහයේ 11 කොටසේ වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකොට ඇති විට එම වරද සිදු කල දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළයුතු වන්නේය.

➢ සක්‍රීය සේවා කාලය

" සක්‍රීය සේවා කාලය " යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයෙන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

➢ නියමිත දිනය

අදාළ කාර්යක්ෂමතා කඩඉම් සමත්විය යුතු දිනය " නියමිත දිනය " ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස් වීම් වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්වන සේවකයන්ට බඳවාගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කල යුතුය.

සකස් කලේ - අත්සන ..........

අත්සන : ..........
නම : N. A. C. ප්‍රියදර්ශනී
තනතුර : කළමනාකරණ සහකාර
දිනය : 2014.10.10

පරීක්ෂා කලේ - ..........

අත්සන : ..........
නම : ඩී. එම්. ආර්. ආර්. වසන්තා
තනතුර : පරිපාලන නිලධාරී (වැ.බ.)
නිල මුද්‍රාව : කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කාර්මික, පරිසර, සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය (බස්නාහිර පළාත)
" ශ්‍රාවස්ති මන්දිරය "
අංක 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.
2014.10.10



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී

යොමු අංකය ..........................................

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ .............. හි සංස්කෘතික නිලධාරි (.............) තනතුර සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................................

නම : එන්. සිල්වා
ලේකම්,
සාම්ප්‍රදායික ..... සංවර්ධන, සුළු ව්‍යාපාර, කර්මාන්ත, පරිසර, සංස්කෘතික හා .....
..........................................

දිනය 2014 . 10 . 10

නිල මුද්‍රාව " ..... මන්දිරය "
අංක 37, ..... මාවත,
..... 07.

යොමු අංකය CSO/PTR/3/2/1 - 16 ..........................................

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය (ද.ප.) .............. හි සංස්කෘතික නිලධාරි (.............) තනතුර සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................................

නම : ..........................................

ප්‍රධාන ලේකම් (බ.ප)

දිනය 2014 . 11 . 21

නිල මුද්‍රාව

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

යොමු අංකය ..........................................

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය (ද.ප) .............. හි සංස්කෘතික නිලධාරි .............. තනතුර සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන ..........................................

නම ..........................................

ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)

දිනය 2015 . 01 . 07

නිල මුද්‍රාව

වී. රාජපක්ෂ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

යොමු අංකය 1/1/4/275 ..........................................

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය (ද.ප) .............. හි සංස්කෘතික නිලධාරි .............. තනතුර සඳහා යෝජිත මෙම උසස් කිරීමේ පරිපාටිය 2015.02.4.දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.

අත්සන ..........................................

නම ..........................................

ආණ්ඩුකාර ලේකම් (බ.ප)

දිනය 2015 . 02 . 10

නිල මුද්‍රාව ..... ..... වර්ධන
බ. ප. ආණ්ඩුකාර ලේකම්,
බ. ප. ආණ්ඩුකාර ලේකම්
98/4, හැව්ලොක් පාර,
කොළඹ 05.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය 1/1/4/275 දිනය 2015.02.10

ඇමුණුම : 1

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ක්ෂේත්‍රගතනිලධාරි සේවා ගණයේ සංස්කෘතික නිලධාරි තනතුර සඳහා වන 1වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය**

1. විභාගය : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ක්ෂේත්‍රගත නිලධාරි සේවා ගණයේ සංස්කෘතික නිලධාරි තනතුර සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය (ලිඛිත පරීක්ෂණය)
2. **විභාගය පිළිබඳ විස්තර :**

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සහ ආයතන සංග්‍රහය | පැය 2 | 100 | 40% |
| බස්නාහිර පළාත් මූල්‍ය රීති සහ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | පැය 2 | 100 | 40% |

3. පවත්වනු ලබන බලධරයා : බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරනු ලබන ආයතනයක්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට එක් වරක් හෝ අවශ්‍යතාවය පරිදි

5. **විභාගය සඳහා වන විෂය නිර්දේශය :**

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති හා ආයතන සංග්‍රහය | බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති හා ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද VI,VII,VIII,XIV,XVII,XXIV,XXV,XXVI,XXVII,XXVIII,XXX,XXXIII,XLVII,XLVIII |
| බස්නාහිර පළාත් මූල්‍ය රීති සහ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | මූල්‍ය රීති සංග්‍රහයේ පරිච්ඡේද I,II,III,IV,V මාර්ගෝපදේශ සංග්‍රහය 2:7:1, 2:7:4, 2:7:5, 2:7:6, 2:7:7 ,3:3:1, 3:3:2, 3:3:3, 3:3:4 |

❖ තමන් කැමති වන්නේ නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට හැකියාව ඇත.

අත්සන : ..................................................
(අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : එස්. හිල්වල..................................
තනතුර : ලේකම්, ..................................
දිනය : ..................................
නිලමුද්‍රාව : ..................................

අංක. 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

ඇමුණුම : 2

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ක්ෂේත්‍රගත නිලධාරි සේවා ගණයේ සංස්කෘතික නිලධාරි තනතුර සඳහා වන 11 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

**1.** විභාගය :බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ක්ෂේත්‍රගත නිලධාරි සේවා ගණයේ සංස්කෘතික නිලධාරි තනතුර සඳහා වන 11 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය(ලිඛිත පරීක්ෂණය)

**2.** විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ අධ්‍යයනය | පැය 3 | 100 | 40% |

**3.** පවත්වනු ලබන බලධරයා :බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරන ආයතනයක්

**4.** පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වසරකට එක් වරක්

**5.** විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ අධ්‍යයනය | ආර්ථික, සාමාජීය,සංවර්ධන, හා කළමනාකරණ විෂය ක්ෂේත්‍රයට අදාළව පිළියෙල වූ ප්‍රශ්න පත්‍රයකි. |

අත්සන: ....................................
(අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ....එන්. හිල්වල..............
තනතුර ලේකම්,
දිනය : ....................
නිල මුද්‍රාව

කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග,
කර්මාන්ත, පරිසර, සංස්කෘතික හා
කලා කටයුතු අමාත්‍යාංශය (බස්නාහිර පළාත)
" ශ්‍රාවස්ති මන්දිරය "
අංක. 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය [illegible] දිනය [illegible]

PDF Compressor Pro

ඇමුණුම : 3

## ශ්‍රේණි උසස්වීම් ලබාගැනීම සඳහා වූ අයදුම්පත්‍රය

**1.** නිලධරයා පිළිබඳ තොරතුරු

1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..................................................

1.2 හැඳුනුම්පත් අංකය : ..................................................

1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ..................................................

1.4 අයත්වන සේවය හා තනතුර : ..................................................

1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : ..................................................

**2.** පත්වීම පිළිබඳ තොරතුරු

2.1 පත්වීම් දිනය : ..................................................

2.2 පත්වීම ස්ථිර කළ දිනය : ..................................................

2.3 සමත්වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය : ..................................................

| සමත්වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත්වූ දිනය |
|---|---|---|
| | | |

2.4 සමත්වූ භාෂා ප්‍රවීනතා මට්ටම හා සමත් දිනය :

| සමත්වූ භාෂා ප්‍රවීනතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත්වූ දිනය |
|---|---|---|
| | | |

**3.** උසස් විමට අදාළ තොරතුරු

3.1 උසස් විමට අපේක්ෂිත ශ්‍රේණිය : 11/1

3.2 උසස් වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය

3.3.1 අවශ්‍ය සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව්/නැත

3.3.2 සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ..................................................

3.3.3 අපේක්ෂිත සක්‍රීය සේවා කාලය සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබේද? ඔව්/නැත



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :1/1/4/275 දිනය : 2015.04.17

3.3.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව්/නැත

උසස්වීමට පූර්වාසන්න පස් වසර තුල සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව්/නැත

3.3.5 විනය දඬුවම් ලබා තිබේද? ඔව්/නැත

**4. අයදුම්කරුගේ ප්‍රකාශය**

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් .................... දින සිට සාමාන්‍ය කාර්යසාධනය යටතේ 11/1 ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ....................

..............................................

නිලධරයාගේ අත්සන

**5. අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය**

නිලධරයා විසින් ඉහතින් දක්වා ඇති කරුණු නිවැරදි බවත් / නිවැරදි නොවන බවත් ඒ අනුව ඉහත නිර්දේශ හා එකඟ වන / එකඟ නොවන බවත් කාරුණිකව දන්වමි.

නම : ........................................................

අත්සන : ................................................

දිනය : ....................................................

නිල මුද්‍රාව : ..........................................



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/1/4/125 දිනය : 2015.02.10